සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | **කතෝලික ධර්මය I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

- **සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.**

---

01. බාරුක් ග්‍රන්ථය අයත් වන පොත් කාණ්ඩය වන්නේ,
(1) දිවැසිවර ග්‍රන්ථ (2) පංච පුස්තකය (3) ප්‍රඥා සාහිත්‍යය (4) ඉතිහාසය පොත්

02. නව ගිවිසුමේ සංදේශ බෙදෙන ප්‍රධාන කොටස් දෙක වන්නේ,
(1) සාමාන්‍ය හසුන් හා වෙනත් හසුන් (2) ශුද්ධ වූ පාවුලුතුමාගේ ලිපි, වෙනත් ලිපි
(3) කතෝලික සංදේශ විශ්ව සංදේශ (4) විශ්ව සංදේශ, සාමාන්‍ය සංදේශ

03. දේව ධාර්මික උපදෙස්වලට අමතරව පාවුළු තුමාගේ හසුන්වල ..... උපදෙස් අඩංගු වේ. හිස් තැනට සුදුසු නිවැරදි පිළිතුරු වන්නේ,
(1) දාර්ශනික (2) දෛනික (3) එඩේරික (4) තාර්කික

04. පීඩාකාරී බලය නියම ලෙස පරාජය වන බව පෙන්වනුයේ,
(1) ද්විත්ව වාදය (2) ආරූඪ කතෘත්වය (3) සංකේත භාවිතය (4) යුගාන්තවාදය

05. පේදුරුතුමා ජේසුස් වහන්සේව අත්අඩංගුවට ගත් පිරිස පසුපසින් ගමන් කළේ,
(1) පිලාත් වෙතය. (2) ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයට.
(3) සැන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාවට. (4) උත්තම පූජකතුමාගේ මැදුරට.

06. හෙරෝද් ජේසුස් වහන්සේව සරදමට ලක්කර නැවත පිලාත් වෙත යවනු ලැබුවේ.
(1) විචිත්‍ර වස්ත්‍ර හඳවමින් (2) කස පහර දෙමින්
(3) චෝදනාවලින් නිදහස් කරමින් (4) මරණීය තීන්දු ලබා දෙමින්

07. සීනයි කඳු මුදුනේ දී දස පනත ලැබීම සිහිකරමින් ජුදයින් පැවැත් වූ මංගල්‍යය,
(1) පාස්කු මංගල්‍යය. (2) පෙන්තකොස්ත මංගල්‍යය.
(3) කුඩාරම් මංගල්‍යය. (4) පව්කමාවේ මංගල්‍යය.

08. ශුද්ධ වූ පාවුලුතුමා තම දෙවන ධර්මදූත චාරිකාව අරඹන්නේ,
(1) බාර්ණාබස් තුමා සමග ය. (2) සීලස් සමඟ ය.
(3) තිමෝතියස්තුමා සමඟ ය. (4) ලූක්තුමා සමඟ ය.

09. 1 කොරෙන්ති ලිපියට අනුව නව පාස්කු මංගල්‍යය පැවැත්වීමේ දී ඇතිකර ගත යුතු ගුණාංග ලෙස දැක්වෙන්නේ,
(1) අවංකකම හා පරිත්‍යාගය. (2) සත්‍යය හා යුක්තිය.
(3) අවංකකම හා සත්‍යය. (4) පරිත්‍යාගය හා යුක්තිය.

10. ප්‍රේමයේ එකමුතුකමේ දේව ප්‍රසාද නිධානය ලෙස සැලකෙන්නේ,
(1) ආශිර්වාදකාර බන්ධනය (2) පූජකවරය
(3) රෝගීන්ගේ ආලේපය (4) දිව්‍ය සත්ප්‍රසාදය

11. අපගේ ජීවිත දෙවියන් වහන්සේට පිදෙන පූජාවක් වන්නේ
(1) ප්‍රශංසාව අපේක්ෂාවෙන් යුතුකම් ඉටු කිරීමෙන් ය.
(2) ඉරුදින දිව්‍ය පූජා යාගයට ඉඳහිට සහභාගි වීමෙන් ය.
(3) අනාගත බලාපොරොත්තු ඉෂ්ට කර ගැනීමෙන් ය.
(4) ජීවිත අභියෝග හමුවේ කිතුනු ශ්‍රාවකත්වයට සාක්ෂි දැරීමෙන් ය.

12. මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාවේ අරමුණ වන්නේ,
(1) යාච්ඤාව හා පශ්චත්තාපික ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග පරාජය කිරීමය.
(2) ආදරය අහිමි අයට ආදරය රැකවරණය ලබා දීමය.
(3) ආර්ථික හා සාමාජීය වශයෙන් ජනතාවගේ ගැටලුවලට විසඳුම් ලබාදීම.
(4) ධනවත් රටවලට එරෙහිව පියවර ගැනීම.

13. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව පාපී ඇල්මෙන් ජීවත් වන මිනිසා එයින් නිදහස් වන බව දක්වන්නේ,
(1) බැහැපත් සිතින් දෙවිඳුන්ට යාච්ඤා කිරීම මඟින්
(2) එකම දෙවියන්ට පමණක් යාච්ඤා කිරීම මඟින්
(3) සෑම අභියෝගයකදී ම දෙවිඳුන්ට ප්‍රශංසා කිරීම මඟින්
(4) දේව පොරොන්දු ඉටු කිරීම මඟින්,

14. හිතෝපදේශ 1 ; 8 ට අනුව ''මාගේ පුත්‍රය..... අවවාදය අසන්න ..... උපදෙස් ඉවත නොදමන්න. හිස්තැනට සුදුසු පිළිතුරු තෝරන්න.
(1) මවගේ, පියාගේ (2) පියාගේ, ගුරුවරයාගේ
(3) පියාගේ, මවගේ (4) ගුරුවරයාගේ, මවගේ

15. මයිදාව නැමැති යහගුණය උපදින්නේ,
(1) හික්මවීම තුළිනි. (2) ඉවසීම තුළිනි.
(3) පරිත්‍යාගශීලී බව තුළිනි. (4) කැපකිරීම තුළිනි.

16. පහත සඳහන් ප්‍රකාශ අතරින් 7 හා 10 පණත් කඩවන අවස්ථා ඇතුළත් පිළිතුර වන්නේ,
A - කොපි කර වංචාකර විභාග සමත් වීම.
B - අසභ්‍ය වචන භාවිතය.
C - පොදු දේපළ විනාශ කිරීම.
D - අනුන්ගේ කාලය නාස්ති කිරීම.
E - තම වරද අන් අය පිට පැටවීම.
(1) ACD (2) ADE (3) BCD (4) ABC

17. අට වැනි පණත නිවැරදිව පිළිපැදීමේදී නිතරම,
(1) ප්‍රිය වචන කත කළ යුතුය. (2) දේව ප්‍රශංසාවට ලක්වන පරිදි ක්‍රියා කළ යුතුය.
(3) අන්‍යයන්ගේ මතවලට ගරු කළ යුතුය. (4) හෘද සාක්ෂියට කතා කිරීමට ඉඩදිය යුතුය.

18. ජනවන්දනා වර්ෂයට අනුව ආලේලුයියා ගායනා කිරීමෙන් වලකින්නේ,
(1) නත්තල් සමයේදී ය. (2) චතාරික සමයේදී ය. (3) ශුද්ධ වූ සතියේදී ය. (4) සාමාන්‍ය සමයේදී ය.

19. දිව්‍ය පූජාවේ ප්‍රධානතම යැදුම ලෙස සැලකෙන්නේ,
(1) විශ්වාස ලක්ෂණය (2) ස්වාමිවාක් ආරාධනය
(3) ස්තෝත්‍ර යාගික යැදුම (4) බොදුනෙන් පසු යැදුම

20. උත්තම පූජක යාච්ඤාව පුරා දිවයන ප්‍රධාන තේමාව,
(1) පූජකවරය (2) අන්තිම රාත්‍රී භෝජනය
(3) දිව්‍ය සත්ප්‍රසාදය (4) එකමුතුකම

21. ජේසුස් වහන්ගේ දුක්ප්‍රාප්ති විස්තරයේ වැදගත්ම ස්ථානයකි,
(1) කපාල පිටිය (2) ගෙත්සෙමෙන
(3) උත්තම පූජක මැදුර (4) ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය

22. කෙටි හා ඍජු සාහිත්‍යමය ශෛලයකින් ඉදිරිපත් කරන දේව ධාර්මික සම්ප්‍රදාය වන්නේ,
(1) යාවේ (2) එළොහිම් (3) ද්විතීය නීති (4) පූජක

23. කතෝලික බයිබලයේ පුරාණ ගිවිසුම ලැබී ඇත්තේ,
(1) සෙප්ටුවාජින්න පිටපතෙනි. (2) මැසරොටික් පිටපතෙනි.
(3) හෙබ්‍රෙව් පිටපතෙනි. (4) ජුදා පිටපතෙනි.

24. මිකායා අයත් වන දිවැසිවර කාණ්ඩය,
(1) ලේඛක (2) දේශක (3) සුළු (4) ප්‍රධාන

25. දෙවියන් වහන්සේ කැඳ වූ දිවැසිවරු අතරින් උදාර චින්තන ශක්තියකින් යුතු දිවැසිවරයෙකු වූ එසකියල් දිවැසිවරයා යවනු ලද්දේ,
(1) ජෙරුසලමේ විසූ ඊශ්‍රායෙල්වරුන් වෙතය.
(2) අසිරියාවේ විසූ ඊශ්‍රායෙල්වරුන් වෙතය.
(3) බැබිලෝනියාවේ විසූ ඊශ්‍රායෙල්වරුන් වෙතය.
(4) ආසියාවේ විසූ ඊශ්‍රායෙල්වරුන් වෙතය.

26. යාච්ඤාවෙන් දෙවිඳුන් අත්දැකීමට අපට ආරාධනා කරන සුභාරංචිය ලියා ඇත්තේ
(1) මතෙව් තුමා (2) මාක් තුමා (3) ජොහාන් තුමා (4) ලූක් තුමා

27. මැවීම පිළිබඳ දෙවන කතාවට අනුව අන් මැවිලිවලට වඩා උතුම් තත්වයක් මිනිසාට ලැබෙන්නේ,
(1) ඔහු දේව සමානකමට මවා ඇති බැවිනි.
(2) ඔහු දූවිල්ලෙන් නිර්මාණය කර ඇති බැවිනි.
(3) ඔහුට දෙවියන් වහන්සේ ජීවන හුස්ම දී ඇති බැවිනි.
(4) ඔහු සියලු සතුන් අතර ප්‍රධාන වන බැවිනි.

28. පව්කරුවා කෙරෙහි දෙවියන් වහන්සේගේ ආදරය හා රැකවරණය පැහැදිලි කරන සිද්ධිය වන්නේ,
(1) ආදී මව්පියන් සඳහා ඒදන් උයන නිර්මාණය කිරීම.
(2) ආදී මව්පියන් සඳහා සම් වස්ත්‍ර සාදා දීම.
(3) නෝවා ඇතුළු පිරිස ජලගැල්මෙන් බේරා ගැනීම.
(4) කායින් වෙනුවෙන් සතුරාගෙන් පළිගැනීම.

29. මෝසෙස් තුමා මගින් මිසරය වෙත එවන ලද තෙවැනි වසංගතය වන්නේ,
(1) මැසි උවදුර (2) කිනිතුලු උවදුර
(3) මැඩි උවදුර (4) ගව සම්පත් වැනසීම

30. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
A - දෙවි සමිඳුන්ගේ නාමය අගරු ලෙස භාවිත නොකරන්න.
B - නුඹේ පියාට ද මවට ද ගෞරව කරන්න.
C - සොරකම් නොකරන්න.
D - අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියන්න.
E - සබත් දින ශුද්ධ ලෙස ගත කිරීමට සිතට ගන්න.
ඉහත සඳහන් පණත් අතරින් අසල්වැසියා හා සබඳතා රැක ගැනීමට ඉවහල්වන පණත් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) BCD (2) ADE (3) CDE (4) ABC

31. දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව වෙත දැක්වූ දේව ආදරයේ විශේෂ සලකුණක් ලෙස සැලකෙන්නේ,
(1) චර්මඡේදනය (2) කානාන් දේශය (3) දේව මන්දිරය (4) දස පණත

32. ''ඔහු ස්වාමීන් වහන්සේ අභිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේය.'' මෙහි සඳහන් ''ඔහු'' යනු,
(1) සලමොන් රජතුමා (2) ස්නාවක ජොහාන් තුමා
(3) ක්‍රිස්තුස් වහන්සේ (4) සකරියස් තුමා

33. ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලබන අවස්ථාවේ අහසින් නැගුණු හඬ සාක්ෂි දැරුවේ කුමකට ද?
(1) ජේසුස් වහන්සේගේ මනුෂ්‍ය පුත්‍රභාවයට.
(2) ජේසුස් වහන්සේගේ ගැලවීමේ කාර්යයට
(3) ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවයට
(4) ජේසුස් වහන්සේගේ දූතික භාවයට.

34. අභිවෘධි ආලේපය මගින් කෙනෙකුට ලැබෙන වරප්‍රසාදයක් වන්නේ,
(1) ශුද්ධ වූ සභාවේ පූර්ණ සමාජිකත්වය ලැබීම.
(2) ශුද්ධ වූ ත්‍රිත්වය තමා තුළට වැඩම කිරීම.
(3) අති ඉන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ අවයවයක් බවට පත්වීම.
(4) දේව රාජ්‍යයේ පංගුකාරකත්වය ලැබීමයි.

35. අධ්‍යාත්මික අස්වැසිල්ලක් හා පූර්ණ චිත්ත සාමයක් අත්වන්නේ,
(1) සමගි සන්ධානයෙනි. (2) රෝගීන්ගේ ආලේපනයෙනි.
(3) පූජකවරයෙනි. (4) අභිවෘද්ධි ආලේපයෙනි.

36. පවුල තුළ උපදින දරුවන් දේව විශ්වාසය තුළ පුරුදු පුහුණු කිරීමේ කාර්යය පැවරෙන්නේ,
(1) දහම් ගුරුවරුන්ට (2) මීසමහාර පියතුමාට
(3) දෙමාපියන්ට (4) වැඩිහිටියන්ට

37. කිතුනු විවාහයක් දික්කසාද කළ නොහැකි බව යනු,
(1) ඒකත්වයයි. (2) මනුෂ්‍යත්වයයි. (3) ගිවිසුමක් බවයි. (4) අඛණ්ඩත්වයයි.

38. පහත සඳහන් පැවිදි නිකායන් අතරින් පැවිදි සොයුරන්ගේ නිකායයන් වන්නේ,
(1) සිරිකුරුස නිකාය / දයාවේ සොයුරන්ගේ නිකාය
(2) ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් නිකාය / නිර්මල මරිය නිකාය
(3) යහපත් එඩේරාගේ නිකාය / ප්‍රැන්සිස්කාන ධර්මදූත නිකාය
(4) මාරිස්ට් නිකාය / ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් නිකාය

39. ගිහි ධර්මදූත සේවාවල නියැලීම සඳහා කැඳවීම ලැබෙන්නේ,
(1) ප්‍රසාද ස්නාපනයෙනි. (2) අභිවෘද්ධි ආලේපනයෙනි.
(3) ආශිර්වාදකාර බන්ධනයෙනි. (4) පොදු පූජකවරයෙනිඩි

40. ශුද්ධ වූ සභාවේ වත්මන් දෘශ්‍යමාන නායකයා වන්නේ,
(1) XIV වන ලියෝ පාප්තුමන් ය. (2) XVI වන බෙනඩික් පාප්තුමන් ය.
(3) II වන ජුවාම් පාවුළු පාප්තුමන් ය. (4) පළමු ප්‍රැන්සිස් පාප්තුමන් ය.

(ලකුණු 1 × 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | **කතෝලික ධර්මය II** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. (i) පාවුළුතුමා විසින් ම ලියන ලද සංදේශ දෙකක් නම් කරන්න.

(ii) පෘතුගීසින් මුහුදුබඩ ප්‍රදේශය පාලනය කළ අවධියේ මෙරටට පැමිණි පැවිදි නිකායන් දෙකක් නම් කරන්න.

(iii) පුරාණ ගිවිසුමේ සඳහන් දවන පූජා වර්ග දෙකක් ලියා දක්වන්න.

(iv) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු දෙකක් ලියන්න.

(v) කතෝලික සභාව පිළිගත් සභා දෙකක් නම් කරන්න.

(vi) ඊශ්‍රායෙල් දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියා දක්වන්න.

(vii) මැවීම පිළිබඳ පළමු කතාව හා දෙවන කතාව අයත් සම්ප්‍රදායන් පිළිවෙලින් ලියා දක්වන්න.

(viii) ජේසුස් වහන්සේ විසින් සිදුකරන ලද ප්‍රාතිහාර්ය වර්ග දෙකක් ලියන්න.

(ix) ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා කරන සංකේතාත්මක ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

(x) පැවිදි නිකායන් කොටස් දෙක නම් කරන්න.

(ලකුණු 10 × 2 = 20)

02. (i) ප්‍රඥා සාහිත්‍යට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(ii) හේබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද තුනක් ලියා දක්වන්න.

(iii) දෙවියන් වහන්සේට ප්‍රිය මනාප දැහැමි දිවියක් ගත කිරීමට ඔබ ක්‍රියාකරන ආකාර පහක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i) පස්වෙනි පණත සහ එය සඳහන් බයිබලීය ග්‍රන්ථය නම් කරන්න.

(ii) ජේසුස් වහන්සේ පස්වැනි පණතට දුන් නව අර්ථකථන තුනක් ලියන්න.

(iii) තමන්ගේ මෙන් ම අන් අයගේ ද ජීවිත සුරැකීම සඳහා ඔබට කළහැකි කාර්යයන් පහක් ලියා විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. (i) මතෙව් හා මාක් සුබාරංචිවල සංකේත පිළිවෙලින් ලියා දක්වන්න.

(ii) ලූක් සුබාරංචිය හඳුන්වන වෙනත් නම් තුනක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව විශ්වාස කර සදාකාල ජීවිතය හිමිකර ගැනීමට පාසල් සිසුවෙකු ලෙස ඔබ ක්‍රියා කරන ආකාර පහක් ලියා විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. (i) දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමඟ ඇතිකරගත් ගිවිසුම ඉදිරිපත් කර ඇති සම්ප්‍රදායයන් දෙක නම් කරන්න.

(ii) ශුද්ධ බයිබලය තුළ දක්නට ලැබෙන ගිවිසුම්වල දැකිය හැකි වෙනස්කම් තුනක් නම් කරන්න.

(iii) දස පනත අනුසාර කරමින් අසල්වැසියා වෙත ඔබගේ යුතුකම් ඉටුකරන ආකාර පහක් ලියා විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (i) ජනතා සේවය සඳහා වන ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.

(ii) නිල පූජකවරයේ ධූර තුන ලියා දක්වන්න.

(iii) පූජාප්‍රසාදී වහන්සේලා වෙනුවෙන් ගිහියන් විසින් කළයුතු යුතුකම් පහක් පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත

(ii) සීනයි ගිවිසුම

(iii) කිතුනු පවුල

(iv) පැවිදි දිවිය

(ලකුණු 2 × 5 = 10)

පිළිතුරු පත්‍රය - I පත්‍රය

01. (1)	02. (2)	03. (3)	04. (4)	05. (4)	06. (1)	07. (2)	08. (2)	09. (3)	10. (4)
11. (4)	12. (1)	13. (2)	14. (3)	15. (1)	16. (1)	17. (4)	18. (2)	19. (3)	20. (4)
21. (2)	22. (2)	23. (1)	24. (2)	25. (3)	26. (4)	27. (3)	28. (2)	29. (2)	30. (1)
31. (4)	32. (2)	33. (3)	34. (1)	35. (1)	36. (3)	37. (4)	38. (4)	39. (3)	40. (1)

(ලකුණු 40)

පිළිතුරු පත්‍රය - II පත්‍රය

01. (i) 1 කොරින්ති, 2 කොරින්ති, රෝම, ගලාති, පිලිප්පි, පිලමොන්, 1 තෙසලෝනික

(ii) ජේසු නිකාය, දොමිනිකාන නිකාය, අගුස්තීනු නිකාය

(iii) ගවයන්, බැටළුවන්, එළුවන්, කුරුල්ලන් (කොබෙයියන් හා පරවියන්)

(iv) දෙවියන් වහන්සේට නමස්කාර කිරීම, දෙවියන් වහන්සේට තුති පිදීම, පාපයට වන්දි ගෙවීම, ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම.

(v) ලංකා සභාව, මෙතෝදිස්ත සභාව, බැප්ටිස්ට් සභාව, ඕලන්ද රෙපරමාදු සභාව, ප්‍රෙස්බිටේරියන් සභාව, දකුණු ඉන්දියානු සභාව, ග්‍රීක ඕතඩොක්ස් සභාව

(vi) දේශක, ලේඛක

(vii) පළමු මැවීමේ කතාව - P පූජක, දෙවන මැවීමේ කතාව - යාවේ J

(viii) රෝගීන් සුව කිරීම, යක්ෂයන් දුරු කිරීම, මළවුන් නැගිටුවීම, සොබාදහම මත බලය පෑම.

(ix) ජලය, සුදු වස්ත්‍රය, පාස්කු ඉටිපහන, ශුද්ධ තෙලය

(x) පැවිදි පූජක, පූජක නොවන පැවිදි අය.

02. (i) ජෝබ්, ගීතාවලිය, හිතෝපදේශය, ධර්ම දේශකයා, ප්‍රේම ගී, ප්‍රඥාව, සිරාක් හෙවත් උපදේශකයා

(ii) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව, රාජ්‍ය සභා ප්‍රඥාව, අභිධාර්මික ප්‍රඥාව, එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව

(iii) සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

03. (i) මිනී නොමරව - නික්මයාම ග්‍රන්ථය

(ii) තමාගේ සහෝදරයා සමඟ කෝපවන කවරකු වූව ද ඔහු අධිකරණයට යටත් වනු ඇත. තමාගේ සහෝදරායාට ''මෝඩයා'' කියා ගරහන කවරකු වූව ද ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වනු ඇත. තමාගේ සහෝදරයාට ''ජඩයා'' කියා ගරහන කවරක වූව ද ඔහු නිරා ගින්නට ගොදුරු වන ඇත.

(iii) ජීවිතය, සෞඛ්‍යය, ගැන සැලකිලිමත් වීම, මත්ද්‍රව්‍ය, මත්වතුර, වැරදි ආහාර පුරුදු ආදියෙන් මිදීම හා අන් අය මුදවා ගැනීම. පුද්ගලයන්ට ආහාර, වස්ත්‍ර ආදරය, කරුණාව, දයාව ලබාදීම වැනි කරුණු ආශ්‍රිතව සිසුවා ලියා ඇති කරුණු

04. (i) මතෙව් - මිනිසා මාක් - සිංහයා

(ii) දයාවේ, කාන්තාවන්ගේ, ශුද්ධාත්මයාණන්ගේ, අන්‍ය ජාතීන්ගේ යාච්ඤාවේ හා දිළින්දන්ගේ ශුභාරංචිය.

(iii) ශුභාරංචි හතරෙහි අඩංගු ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පණිවිඩය අනුව ජීවත්වන ආකාරය සමඟ ගළපා ලියා තිබේනම්, සිසුවා ලියා ඇති කරුණු සලකා බලන්න.

05. (i) යාවේ සම්ප්‍රදාය, පූජක සම්ප්‍රදාය

(ii) ගිවිසුමට මුලපුරන්නේ දෙවියන් වහන්සේය, එහෙත් දෙවියන් වහන්සේ හා මිනිසා අතර අසීමිත පරතරයක් ඇත. දෙවියන් වහන්සේ එම ගිවිසුම් පොරොන්දුවලට පක්ෂපාත වුව ද මිනිසා එම පොරොන්දු බොහෝ විට කඩ කරයි.

(iii) දස පනතේ පනත් අනුව ජීවත් වෙමින් සිදුකරන කාර්යයන් විස්තර කර තිබීම ප්‍රමාණවත්ය.

06. (i) පූජකවරය, ආශිර්වාදකාර බන්ධනය

(ii) රදගුරු, පූජක, තේවාචාරී

(iii) ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම හා ඔවුන්ට ගෞරව කිරීම. / මීසමේ සේවාවන්ට සහය දීම. / දේව රාජ්‍යය පතළ කිරීමේ කටයුතුවලට සහය වීම. / ධර්මෝපදේශ සේවාවන්ට සම්බන්ධ වීම. / ජනවන්දවා කටයුතුවලට සහය වීම. / පොදු වැඩ කටයුතුවල දී සහයෝගය දීම. / පූජාප්‍රසාදිතුමන්ලව නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම.

07. (i) 10 පෙළපොත 5 පිටුව (ii) 11 පෙළපොත 33 පිටව

(iii) 10 පෙළපොත 75 පිටුව (iv) 11 පෙළපොත 82 පිටුව